**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහන - 2 කොටස - 2020**
---

**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහනේ - 2 කොටසේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 ජුනි 03 දින එළඹි අංක 3030 දරන ණය ගිවිසුමේ IV වාවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

**ණය ගිවිසුමට අනුව, එවකට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා වැඩිදියුණු කිරීම හා කළමනාකරණය කිරීම සහ මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදනය හා අපජල සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. ණය ගිවිසුම ප්‍රකාරව වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,230.60 කට සමාන එජඩො මිලියන 9.44 ක් වන අතර ඉන් රු.මිලියන 1,042.88 කට සමාන එජඩො මිලියන 08 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 187.22 කට සමාන එජඩො මිලියන 1.44 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. වැඩසටහන එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 23 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, වැඩසටහනේ කටයුතු අවසන් කිරීමේ දිනය 2022 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.**

## 1.3 මතය

**වැඩසටහනේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

## 1.4 මතය සඳහා පදනම

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.**

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා**

ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | කළමණාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| වැඩසටහනට අදාල ණය පොළිය නිවැරදිව හඳුනාගෙන නොතිබුණු අතර **2020** දෙසැම්බර් **31** දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි. | පොළී පිරිවැය වඩාත් සුදුසු ආකාරයට වෙන්කර ගැනීමට ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ භාණ්ඩාගාරය සමග කටයුතු කිරීමට පියවර ගෙන ඇත. | මෙම අවශ්‍යතාවය සමග අනුකූල වීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

### 2.2 රීති රෙගුලාසිවලට සමග අනුකූල නොවීම

| නීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| **2019** මාර්තු **05** දිනැති අංක **2019/01** දරණ කළමණාකරන සේවා චක්‍රලේඛයේ **9.3** වගන්තිය | සමාලෝචන කමිටු මාස **02** කට වරක් පැවැත්විය යුතු වුවද **2020** වර්ෂය තුළදී සමාලෝචන කමිටු රැස්වීම් **02**ක් පමණක් පවත්වා තිබුණි. | **2020** මාර්තු මස සිට පැවති තත්ත්වය නිසා කොවිඩ් තත්ත්වය වලක්වාලීම පිළිබඳ මාර්ගෝපදේශ වලට අනුගතවෙමින් එවැනි කණ්ඩායම් සඳහා රුස්වීම් සංවිධානයට නොහැකි විය. | විකල්පයක් ලෙස මාර්ග ගත රැස්වීම් පැවැත්වීම කළ යුතුව තිබුණි. |

**3.** භෞතික කාර්යසාධනය

**3.1** ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම් | 2020 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/ විගණන ගැටලුව | ප්‍රමාදය සඳහා හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | අත්කරගත් කාර්යසාධනය ප්‍රතිශතය | | |
| (1) නිර්මානකරණ අධීක්ෂණය සහ ආයතනික සංවර්ධනය සඳහා සහය | නිර්මානකරණ අධීක්ෂණය සහ ආයතනික සංවර්ධනය සඳහා සහය | 100 | 55.03 | 2016 අප්‍රේල් මස 25 දින SMEC International පුද්ගලික සමාගම වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු අතර කොන්ත්‍රාත් කාලය 2020 අප්‍රේල් මස 25 දින අවසන් වී තිබුණි. මෙම සංරචකය සඳහා රු.මිලියන 539ක් වෙන් කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුට රු.මිලියන 441.6ක් ගෙවා තිබුණද කොන්ත්‍රාත්කරුට අනුමත කොන්ත්‍රාත් කාලය තුල කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට නොහැකි වී තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අවසන් වී 2020 දෙසැම්බර් 31 දිනට මාස 8ක් ගතවී තිබුණද එම ගිවිසුමේ කාලය දීර්ඝ කිරීමට පියවර ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාදවීම, නගරයේ ජාතික සංවර්ධනය සලකමින් අමතර විෂයපථයන් පැවරීම සහ දුර්වල අධීක්ෂණය |
| (2) කිලෝමීටර 97.2ක මලාපවහන හා නාලිකාවල තත්ත්ව පරීක්ෂාවන් සිදු කිරීම සීසීටීවී-කොන්ත්‍රාත්තුව | කිලෝමීටර 97.2ක මලාපවහන හා නාලිකාවල තත්ත්ව පරීක්ෂාවන් සිදු කිරීම සීසීටීවී-කොන්ත්‍රාත්තුව | 100 | - | ලංසු ක්‍රියාවලිය 2016 වර්ෂයේදී ආරම්භ කර තිබුණද කොන්ත්‍රාත්තුව 2020 දෙසැම්බර් 31 දින වන තෙක් ප්‍රදානය කර නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය සිදුවීම |

| | |
|---|---|
| කළමනාකරණයේ ප්‍රතිචාරය | අදියර 2 හා 3 දෙකෙහිම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් සිදුවී තිබුණි. නගරයේ ජාතික සංවර්ධන කටයුතු සලකමින් අතිරේක වැඩ විෂය පථය පැවරීම සහ සිදුකරමින් පවතින කොන්ත්‍රාත් පැකේජවල අඩු කාර්යසාධනය, කිරුළපන පෝෂක ප්‍රදේශයේ නව ගුරුත්වාකර්ශණ මලපවාහන පද්ධතිය, ප්‍රධාන පොම්පාගාර, සහ පීඩන මධස්ථාන ඉදිකිරීම උපදේශන කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමට හේතුවී තිබුණි. |
| විගනකගේ නිර්දේශය | වැඩසටහනේ කාලපරිච්ඡේදය ඉකුත්වීමට පෙර වැඩසටහනේ කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටළුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| සීසීටීවී තාක්ෂණය භාවිතයෙන් අප ජල පිරිසිදු කිරීමේ සමීක්ෂණය සහ කිලෝමීටර් 108 ක අප ජල නාලිකා පිළිබඳ දත්ත පද්ධතියක් පිළියෙල කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2016 ජුලි 01 දින ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණි. කෙසේවෙතත්, ඒ සඳහා වන කොන්ත්‍රාත්තුව 2020 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රදානය කර නොතිබුණි. | අවශ්‍ය අමතර මුදල් වැල්ලවත්ත අපජල පිරිපහදු කොන්ත්‍රාත්තුවේ පවතින ඉතුරුම් මගින් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. | වැඩසටහනේ කාලපරිච්ඡේදය ඉකුත්වීමට පෙර වැඩසටහනේ කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

### 3.3 මානව සම්පත් කළමනාකරණයට අදාල ගැටලු

| කාර්ය මණ්ඩල තනතුරු | තනතුරු සංඛයාව | | | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | අනුමත | 2020 දෙසැම්බර් 31 දිනට තත්‍ය | පුරප්පාඩු සංඛ්‍යාව | | |
| ඉදිකිරීම් කළමණාකරු | 02 | 01 | 01 | ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් නොමැතිවීමෙන් ව්‍යාපෘති කළමණාකරන ඒකකයේ කාර්යසාධනයට බලපාන බව පිළිගනී. | සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයකින් පුරප්පාඩු පිරවීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| ව්‍යාපෘති ඉංජිනේරු | 08 | 02 | 06 | | |
| ව්‍යාපෘති ඉංජිනේරු (පුහුණු) | 01 | - | 01 | | |
| සහකාර ව්‍යාපෘති ඉංජිනේරු | 08 | 03 | 05 | | |
| | 19 | 06 | 13 | | |